# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2254/48 – 2021 නොවැම්බර් 19 වැනි සිකුරාදා – 2021.11.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2016/151.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2020.12.28 වැනි දින අංක 2208/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.12.10 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. කාන්ති කළුආරච්චි මෙය, අංක 62/25, කටුකුරුන්ද වත්ත, මාවරමණ්ඩිය, කඩවත.
2. සුනිල් රත්නසිරි මයා, අංක 22/14, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය.
3. ටයිටස් පෙරේරා මයා, අංක 76/1බී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන.
4. ඊ. ඩී. කුමුදිනී මිය, අංක 493, කටුකුරුඳුවත්ත, ගල්කිස්ස.
5. ඩී.එම්.ජයවීර මයා, අංක 93/6, මීගහවත්ත පාර, දෙල්ගොඩ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ - 01

අතර පවත්නා 2020.12.08 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ජනාධිපති නීතිඥ සුහද කල්‍යාණ ගම්ලත් මහතා වෙත යොමු කරන ලදී.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2020.12.10 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

12 - 25/1

---

මගේ අංකය: IR/COM/01/2016/151.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**
4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්:*

1. කාන්ති කළුආරච්චි මෙය, අංක 62/25, කටුකුරුන්ද වත්ත, මාවරමණ්ඩිය, කඩවත.
2. සුනිල් රත්නසිරි මයා, අංක 22/14, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය.
3. ටයිටස් පෙරේරා මයා, අංක 76/1 බී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන.
4. ඊ. ඩී. කුමුදිනී මිය, අංක 493, කටුකුරුඳුවත්ත, ගල්කිස්ස.
5. ඩී.එම්.ජයවීර මයා, අංක 93/6, මීගහවත්ත පාර, දෙල්ගොඩ.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්:*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ - 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බණ්ඩාරවෙල, කොළතැන්න, හිල්ඔය පාර, රික්ටන්, රවීන්ද්‍ර ලාල් ගුණවර්ධන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2016/151.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන් :*

1. කාන්ති කළුආරච්චි මෙය, අංක 62/25, කටුකුරුන්ද වත්ත, මාවරමණ්ඩිය, කඩවත.
2. සුනිල් රත්නසිරි මයා, අංක 22/14, අරලිය උයන, දෙපානම, පන්නිපිටිය.
3. ටයිටස් පෙරේරා මයා, අංක 76/1 බී, ශ්‍රී ධර්මාරාම පාර, රත්මලාන.
4. ඊ. ඩී. කුමුදිනී මිය, අංක 493, කටුකුරුඳුවත්ත, ගල්කිස්ස.

5. ඩී.එම්.ජයවීර මයා, අංක 93/6, මීගහවත්ත පාර, දෙල්ගොඩ.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන් :*

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ - 01.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ** වනුයේ,

''ඉහත නම් සඳහන් සේවකයින් පස්දෙනා හට විධායක II ශ්‍රේණියේ කළමනාකරු (මුදල්) තනතුරෙහි සිට විධායක I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු (මුදල්) තනතුර දක්වා උසස්වීමේ අවස්ථාව අහිමි කිරීම මගින් එකී සේවකයන්ට යම් අසාධාරණයක් සිදු වූයේද යන්න හා එසේ අසාධාරණයක් සිදුවූයේ නම් ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් මොනවාද ? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 නොවැම්බර් මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

12– 25/2

---

මගේ අංකය: IR/COM/03/2017/08.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2019.04.03 වැනි දින අංක 2117/27 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.26 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශවයක් වශයෙන්,*

බී. එම්.කුමාරසිංහ මයා, ගඩුගුඩුවාව, 15 කණුව, උඌරණිය.

*සහ*

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර පවත්නා 2019.03.18 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්.ජී. සූරියආරච්චි මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2019.03.26 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

12 - 26/1

මගේ අංකය: IR/COM/03/2017/08.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

බී. එම්.කුමාරසිංහ මයා, ගඩුගුඩුවාව, 15 කණුව, ඌරණිය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, ජී. එච්. පෙරේරා මාවත, අංක 43/1, නීතිඥ ටී.සී.ජේ. පීරිස් මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2017/08.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

බී. එම්.කුමාරසිංහ මයා, ගඩුගුඩුවාව, 15 කණුව, ඌරණිය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු** වනුයේ,

''ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ මහියංගන ඩිපෝවට අනුයුක්තව රියදුරෙකු ලෙස සේවය කළ බී. එම්. කුමාරසිංහ මහතාට වෛද්‍ය හේතු මත විශ්‍රාම ගැන්වීමේදී ඔහුට ගෙවනු ලැබූ වන්දි මුදල තීරණය කිරීමට අනුගමනය කර

ඇති ක්‍රියාමාර්ග යුක්තිසහගතද ? එසේ නොවේ නම් ඒ මහතාට හිමිවිය යුතු සහනයන් කවරේ ද'' යන්න පිළිබඳව වේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 නොවැම්බර් මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

12 - 26/2

---

මගේ අංකය: IR/COM/05/2018/265.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ** 4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 10, නගරසභා පටුමඟ, දෙහිවල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ඩිලාරූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්, අපනයන සැකසුම් කලාපය, බියගම, මල්වාන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගම්පහ, උසාවිය පාර, අංක 09, නීතිඥ ජනජිත් ද සිල්වා මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 නොවැම්බර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2018/265.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 10, නගරසභා පටුමග, දෙහිවල.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ඩිලාරූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්, අපනයන සැකසුම් කලාපය, බියගම, මල්වාන.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ඩිලාරූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ මුද්‍රණ අංශයේ සේවය කරන ලද පහත නම් සඳහන් සේවකයින් 21 දෙනාහට සම්පූර්ණ වැඩ පැය ගණනම එම අංශයේ සේවය කිරීමට ලබා නොදී (24 x 7) සේවා මුරය අහිමි කිරීමෙන් යම් අසාධාරණයක් සිදුවී තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන් එකිනෙකාට ලැබිය යුතු සහනයන් කවරේ ද? යන්නත් පිළිබඳව වේ.''

01. ටෙරන්ස් ජයතිලක
02. ආර්. බුද්ධික රාජපක්ෂ
03. එම්. ඒ. එන්. ප්‍රසංග ජයවර්ධන
04. ආර්. ආර්. සුමේධ ආරියසිංහ
05. පාලිත කුමාර
06. සචින්ත පෙරේරා
07. බුද්ධි දළුගම
08. ජානක හෙට්ටිආරච්චි
09. පුබුදු රුවන්
10. දමිත් පෙරේරා
11. පී. ඒ. ජගත්
12. සුරන්ජිත් උදයකුමාර
13. ප්‍රදීප් මාලින්ද
14. අනුරාධ වල්පොල
15. කෝකිල වසන්ත
16. ආර්. ටී. ඩී. රාජපක්ෂ
17. ප්‍රදීප් නිශාන්ත
18. ඉරේෂ් නුවන්
19. ප්‍රීමාල් පෙරේරා
20. මනෝජ් පීරිස්
21. ඉසුරු මල්ලවආරච්චි

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 නොවැම්බර් මස 09 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

12 – 27

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.